# (ඇමුණුම 01)

**දුම්වැටි හා මද්‍යසාර භාවිතය ඇතුළත් ජවනිකා සම්බන්ධයෙන් 2011.09.01 දින සිට රූපවාහිනී නාලිකා විසින් පිළිපැදිය යුතු විධිවිධාන**

**පූර්විකාව**

රූපවාහිනී වැඩසටහන් නැරඹීම, ළමා ළපටි වයසේ සිට වයෝවෘද්ධ වන තෙක් සෑම කෙනෙකුම පාහේ අඩු වැඩි වශයෙන් කරන දෙයකි. ලෝකයේ විවිධ රටවල කරන ලද පර්යේෂණාත්මක අධ්‍යනවලින් සනාථ වී තිබෙන එක් වැදගත් කරුණක් අවධාරණය කළ යුතුය. එනම් දුම්කොළ සහ මද්‍යසාර භාවිතය සහිත ජවනිකා රූපවාහිනී මාධ්‍ය ඔස්සේ නරඹන සමහරුන් විශේෂයෙන් වැඩිහිටියන් අනුකරණය කිරීමට නිරායාසයෙන් පෙළඹෙන හය හතර නොදත් දරුවන් ඒවා භාවිතයට ගොදුරු වන බවයි. ඒ දුම්වැටි ඉරීම සහ අරක්කු බීම මනමෝහනීය ක්‍රියාවලියක්ය, යන මායාව එවැනි ජවනිකා වලින් නිරූපනය වන බැවිනි.

දුම්වැටි සහ මද්‍යසාර නිශ්පාදන වනාහි ලෝ පුරා මිනිසුන් රෝගී කරවන, අකාලයේ ඝාතනය කරවන ප්‍රධාන හේතු කාරක දෙකකි. ඊට අමතරව ඒවා භාවිතයෙන් ජනිත වන සමාජීය සහ ආර්ථික ආදීනව සුළුපටු නොවේ. දුම්කොළ හා මද්‍යසාර භාවිතය සමාජ ජීවිතයට වෙහෙසින් අහිතකරය. මත් උවදුරෙන් ලංකාවාසී ජනතාවට සිදුවන විනාශය පිළිබඳව සංවේදී වූ අතිගරු ජනාධිපතිතුමා සිය පරමාදර්ශී මතට තිත සංකල්පය 2005 වර්ෂයේදී රට හමුවේ තැබූ බව ප්‍රකට කරුණකි. එය ක්‍රියාත්මක කිරීමයි, සමස්ත සමාජය හමුවේ මේ වනවිට තිබෙන අභියෝගය.

මතට තිත, සංකල්පය ක්‍රියාවට නැංවීමේ මූලික වගකීමක් ඇති ආයතන අතර දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය හෙවත් NATA ආයතනයට හිමි වන්නේ ප්‍රමුඛස්ථානයකි. ඒ රාජකාරිය ඉටුකරනු වස් NATA ආයතනය, ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශ ලේකම්තුමාගේ සහාය නිරතුරුව අපේක්ෂා කළ අතර එය නොබඳවම ලැබුණු බව නොවළහා පැවසිය යුතුය.

දුම්කොළ හෝ මද්‍යසාර භාවිතය සම්බන්ධ ජවනිකා දැක්වෙන අවස්ථාවන්හිදී දෘශ්‍ය මාධ්‍ය විසින් මේ දක්වා අනුගමනය කරනු ලබන කොටු දැමීම හෙවත් මොසැයික ක්‍රමය, සාර්ථක ක්‍රමයක් නොවන බවට තහවුරු වී ඇති අතර එය දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය විසින් අනුමත ක්‍රමවේදයක්ද නොවේ. එබැවින් 2011 සැප්තැම්බර් මාසයේ සිට මෙම කොටු දැමීමේ ක්‍රමය ඉවත් කළ යුතු බව ජනමාධ්‍ය ලේකම් විසින් මේ වනවිටත් ලිඛිතව මාධ්‍ය ආයතන වෙත දැනුම් දී තිබේ.

මේ වන විට NATA ආයතනයට පැවරී තිබෙන්නේ රූපවාහිනී නාලිකාවල ප්‍රදර්ශනය වන දුම්වැටි සහ මද්‍යසාර භාවිත කරන අවස්ථා සම්බන්ධව ප්‍රතිපත්ති මාලාවක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීමයි. ඒ ව්‍යාපෘතියේ මුඛ්‍ය අරමුණ අපේ අහිංසක දරු පරපුර මේ ව්‍යසනයට ගොදුරුව අකාලයේ මිලිනව යෑම වැළැක්වීමය. ඒ අරමුණ සාක්ෂාත් කර ගැනීමට අනුගමනය කල යුතු ක්‍රියා පටිපාටිය පහත පරිදිය.

01. **නව ක්‍රමවේදය 2011.09.01 දින සිට ක්‍රියාත්මක කළ යුතුය.**

02. **ඒ අනුව 2011.09.01 දා සිට කළ යුතුව ඇත්තේ දුම්වැටි හෝ මද්‍යසාර අන්තර්ගත ජවනිකා රහිත නිර්මාණ හා වැඩසටහන් විකාශය කිරීමය. යම් හෙයකින් දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක වීමට ප්‍රථම එනම් 2006.12.01 දිනට පෙර නිපදවන ලද එවැනි නාම මාත්‍ර අදහසක් හෝ අන්තර්ගත ජවනිකා සහිත වැඩසටහන් ප්‍රචාරය කිරීමට සිදුවේනම් ඒවා ඉවත් කිරීම ප්‍රායෝගික නොවන අවස්ථාවල රූපවාහිනී නාලිකා අනුගමනය කළ යුතු ක්‍රියාවලිය වන්නේ එවැනි ජවනිකා දැක්වෙන අවස්ථාවලදී මොයැසික ක්‍රමය වෙනුවට අධිකාරිය විසින් ුනුමත මත් විරෝධී පණිවිඩ, පහත දැක්වෙන විධිවිධානවලට අනුකූලව ප්‍රචාරය කිරීමය.**

    i. **වැඩසටහන විකාශය වීමට පූර්වාසන්න තත්පර 20ක සම්පූර්ණ කාලය තුළ NATA ආයතනය විසින් සපයා ඇති ආරම්භක පණිවිඩය පමණක් රූපවාහිනී තිරයේ බාධා රහිතව ප්‍රදර්ශනය කළ යුතුය.**
    ii. **වැඩසටහන විකාශය වන කාලය තුළ දුම්වැටි හෝ මද්‍යසාර භාවිතය දිස්වන සෑම අවස්ථාවකදීම තිරයේ පහෙන් එකකට නොඅඩු තීරුවක ඉහළින් හෝ පහලින් දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (NATA) විසින් සපයා ඇති පණිවිඩ ජවනිකාව දිස් වන මුළු කාලය තුළ බාධා රහිතව ප්‍රදර්ශනය කළ යුතුය.**
    iii. **එක් භාෂාවකින් නිපදවන ලද වැඩසටහනක් වෙනත් භාෂාවකට අයත් ප්‍රේක්ෂකයන් බහුතරයක් වෙනුවෙන් උපසිරස්තල සහිතව හෝ හඬ කවා හෝ ප්‍රදර්ශනය කරන අවස්ථාවන්හිදී මත් විරෝධී පණිවිඩ එම දෙවැනි භාෂාවෙන් පළ කළ යුතුය.**

(ඇමුණුම 01)

03. **පණිවිඩ ප්‍රදර්ශනය පිළිබඳ පැහැදිලි කිරීම**

- **i.** **දුම්වැටි හෝ මද්‍යසාර භාවිතය සහිත ජවනිකාවක් දිස් වන සම්පූර්ණ කාලය තුළ මත් විරෝධී පණිවිඩය විකාශය විය යුතුය.**
- **ii.** **දුම්වැටි හෝ මද්‍යසාර භාවිත වන ජවනිකා තත්පර 05කට අඩු කාලයක් තුළ ප්‍රදර්හනය වූවත් මත් විරෝධී පණිවිඩය ප්‍රදර්ශනය විය යුතු අවම කාලය තත්පර 05ක් විය යුතුය.**
- **iii.** **දුම්වැටි පමණක් ඇතුලත් ජවනිකා වලදී දුම්වැටි පිළිබඳ පිණිවිඩ විකාශය විය යුතුය.**
- **iv.** **මද්‍යසාර පමණක් ඇතුලත් ජවනිකාවලදී මද්‍යසාර භාවිතය පිළිබඳ පණිවිඩ විකාශය විය යුතුය.**
- **v.** **දුම්වැටි හා මද්‍යසාර යන දෙකම භාවිත වන ජවනිකා වලදී පණිවිඩ අංක 03 (මෙවැනි දර්ශන දුම්කොළ කර්මාන්තය විසින් මුදල් ගෙවා ඇතුළු කර ඇති බවට ශාක්ෂ්‍ය තිබේ.) සහ 05 (මොනවා පෙන්නුවත් මද්‍යසාර ඔබේ සියල්ල අඩපණ කරයි.) මාරුවෙන් මාරුවට විකාශය විය යුතුය.**
- **vi.** **සපයා ඇති පණිවිඩ චක්‍රීය රටාවකට අනුව උචිත පරිදි තිරයේ දිස්වන ජවනිකාවලට අදාළව විකාශය කළ යුතුය. ඉන් අදහස් වන්නේ මේ පණිවිඩ අතරින් එකක් පමණක් නොව සියළුම පණිවිඩ වරින් වර මාරුවෙන් මාරුවට විකාශය විය යුතු බවයි.**

04. **දුම්වැටි හා මද්‍යසාර භාවිතයට සම්බන්ධ ජවනිකා ආශ්‍රිතව රූපවාහිනී නාලිකා විසින් විකාශය කළ යුත්තේ NATA අධිකාරිය විසින් සපයා ඇති පණිවිඩ පමණකි. ඒවාට බාධා කරවන වෙනත් කිසිවක් එම අවස්ථාවේදී ප්‍රචාරය නොකළ යුතුය.**

05. **අවශ්‍යතාව මත වරින්වර NATA ආයතනය විසින් මෙම පණිවිඩ සහ ක්‍රමවේදය අලුත් කරනු ඇත.**

06. **මෙම විධිවිධාන මෙරට සියලුම රූපවාහිනී නාලිකා සඳහා අදාළ වේ.**

**<u>පූර්වයෙන් ප්‍රචාරය කළ යුතු පණිවිඩය</u>**

**ප්‍රවේශම් වන්න !**

**දුම්කොළ භාවිතය සහ මද්‍යසාර භාවිතය, හෘද රෝග, අංශභාගය, දියවැඩියාව, පිළිකා සහ පෙණහලු රෝගවලට ප්‍රධාන හේතුකාරක වේ. ඒවායින් සිදුවන හානි වසන් කරන දර්ශන හෝ දෙබස් හෝ මේ වැඩසටහනේ ඇතුළත් විය හැකිය. කරුණාකර ඔබේ භයහතර නොදත් අහිංසක දරුවාට ඒ බව කියා දෙන්න.**

<u>දුම්කොළ විරෝධී පණිවිඩ :</u>

01. **දුම්බීම ලිංගික අප්‍රාණිකත්වය ඇතිකරයි.**
02. **දුම්බීම පිළිකා ඇති කරයි.**
03. **මෙවැනි දර්ශන දුම්කොළ කර්මාන්තය විසින් මුදල් ගෙවා ඇතුළු කර ඇති බවට ශාක්ෂ්‍ය තිබේ.**

**<u>මද්‍යසාර විරෝධී පණිවිඩ :</u>**

**01.** **මද්‍යසාර දර්ශන දැකීමෙන් ඔබේ දරුවා මතට යොමුවිය හැකිය.**
**02.** **මොනවා පෙන්නුවත් මද්‍යසාර ඔබේ සියල්ල අඩපණ කරයි.**
**03.** **මද්‍යසාර රගපෑම්වලට රැවටෙන්න එපා.**

අපගේ දරු පරපුරේ පහපත සඳහා දුම්වැටි හා මද්‍යසාර භාවිතය දිරිගන්වනසුලු දර්හන හෝ දෙබස් සෘජුව හෝ වක්‍රව ඇතුළත් ටෙලිනාට්‍ය වැනි විවිධ වැඩසටහන් ඉදිරියේදී නිශ්පාදනය නොකරන ලෙස ප්‍රථමයෙන් නිශ්පාදනකරුවන්ගෙන් උදක්ම ඉල්ලා සිටිමි. එවැනි වැඩසටහන් විකාශය නොකරන ලෙස මාධ්‍ය ආයතන වෙතින්ද ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමි. "අවබෝධයෙන් නිවාරණය කරා" යන ගමනට සැබෑ ජනහිතකාමී මාධ්‍ය මෙහෙවරක නිරත ඔබ සැමටද ආරාධනා කරමි.

සභාපති
දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය